# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,185—1960 අගෝස්තු 19 වැනි සිකුරාදා—19.8.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 165 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | 169 | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 172 | මාර්ග කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | 172 |


### පළාත් පාලන නිවේදන

#### ගම්සභා ආඥාපනත—198 වැනි පරිච්ඡේදය

##### කම්මල් පත්තු ගම්කාර්‍ය සභාව

හලාවත දිස්ත්‍රික්කයේ කම්මල් පත්තු ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

1960.7.27 වැනි දින,
ගම්කාර්‍යසභා කාර්‍යාලය,
වෙන්නප්පුව.

ඩබ්ලිව්. අයි. හියු ප්‍රනාන්දු,
ගම්කාර්‍ය සභාවේ සභාපතිතැන.

##### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සහා අතුරු ව්‍යවස්ථා ආඥාපණතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කම්මල් පත්තු ගම්කාර්‍ය සභාව විසින් 1954 ජනවාරි මස 29 වැනි දින අංක 10,634 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පල කරන ලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු අතුරු ව්‍යවස්ථා 4 වැනි කාණ්ඩයේ (1) වැනි අතුරු ව්‍යවස්ථා ප්‍රකාර මෙහි පහත සඳහන් කර ඇති පාරවල් සහ අඩිපාරවල ඉදිරියෙන් සඳහන් කර ඇති නියම දිග පළල අනුව එකී පාරවල් සෑදීම හා ප්‍රතිශංස්කරණය කිරීමට මෙම ගම්කාර්‍ය සභාව විසින් සම්මත කර ගන්නාලදී :—

| ඡන්ද කොට්ඨාශයේ නම සහ අංකය | පාරේ සහ අඩි පාරේ නම | දිග දම්වැල් | දිග යාර | පළල අඩි |
|---|---|---|---|---|
| 1. අලුත්තොට ... | 1. මදටියගහපාර ... ... ... ... | 14 | 4 ... | 18 |
| | 2. ග්‍රාසියන් පාර ... ... ... ... | 4 | 10 ... | 15 |
| | 3. කිරිල්ලගහ පාර ... ... ... ... | 33 | 14 ... | 19 |
| | 4. දලුපොත පාර ... ... ... ... | 23 | 16 ... | 12 |
| | 5. කමත පාර ... ... ... ... | 23 | 16 ... | 15 |
| | 6. ගිංඔය පාර ... ... ... ... | 10 | 13 ... | 19 |
| | 7. ආනවුලුන්දන් පාර ... ... ... ... | 27 | 12 ... | 18 |

| ඡන්ද කොට්ඨාශයේ නම සහ අංකය | පාරේ සහ අඩි පාරේ නම | දිග දම්වැල් | යාර | පළල අඩි |
|---|---|---|---|---|
| 2. තඹරාවිල | 8. තෝප්පුතොට පාර | 37 | 15 | 36 |
| | 9. පල්ලිය ළඟ පාර | 48 | 5 | 21 |
| | 10. තඹරාවිල මෝල පාර | 15 | 12 | 23 |
| | 11. ගොඩැල්ල පාර | 8 | 3 | 27 |
| | 12. මා ඔය පාර | 23 | 16 | 20 |
| | 13. තඹරාවිල ගංගොඩ පාර | 38 | 11 | 17 |
| 3. නන්ජුන්ඩන්කරේ | 14. වීදි පාර | 42 | 17 | 28 |
| | 15. පාලම් පාර | 16 | — | 17 |
| | 16. මිණිපිටිය පාර | 16 | — | 17 |
| | 17. ගංගොඩ පාර | 7 | 16 | 15 |
| | 18. අඩි පාර | 40 | — | 10 |
| | 19. මුහුදු වෙරළ පාර | 27 | 9 | 20 |
| | 20. කුලමුල්ල අලුත්තොට පාර | 20 | 17 | 12 |
| | 21. නන්ජුන්ඩන්කරේ කම්මල පාර | 25 | 3 | 33 |
| | 22. කුලමුල්ල වයික්කාල පාර | 32 | 12 | 20 |
| 4. වයික්කාල | 23. වයික්කාල පරණ තෝප්පු පාර | 76 | 5 | 35 |
| | 24. මහ ඔය පාර | 10 | 13 | 20 |
| | 25. මිණිපිටිය පාර | 9 | 2 | 17 |
| | 26. හරස් පාර | 12 | 19 | 20 |
| | 27. ගමමැද පාර | 7 | 16 | 12 |
| | 28. රදකොටුපල පාර | 7 | 2 | 14 |
| 5. රන්ගම්මුල්ල | 29. උතුරුකම්මල පාර | 46 | 5 | 24 |
| | 30. ගිංඔය පාර | 23 | 16 | 20 |
| | 31. සාන්ත රීටා පාර | 32 | — | 6 |
| | 33. උතුරු කම්මල සාන්ත ඔදිලියා පාර | 32 | — | 16 |
| | 34. උතුරු කම්මල මුහුදුවෙරළ පාර | 16 | — | 20 |
| | 35. බෝලවත්ත රන්ගම්මුල්ල පාර | 36 | — | 22 |
| 6. අන්ගම්පිටිය | 36. සාන්ත මරියා පාර | 35 | 4 | 20 |
| | 37. සාන්ත සෙබස්තියන් පාර | 24 | — | 20 |
| | 38. වීදි පාර | 22 | 13 | 18 |
| | 39. පාතිමා පාර | 22 | 16 | 12 |
| | 40. පල්ලිය පාර | 26 | 12 | 16 |
| | 41. බෝලවත්ත ගන්ගොඩ පාර | 76 | 16 | 26 |
| 7. නැ. නයිනමඩම | 42. ගිංඔය පාර අංක 1 | 40 | — | 20 |
| | 43. ගිංඔය පාර අංක 2 | 23 | 16 | 14 |
| | 44. හණතොටුපල පාර | 24 | 8 | 22 |
| | 45. පල්ලිය ළඟ පාර | 21 | 7 | 26 |
| | 46. ගමමැද පාර | 30 | 7 | 14 |
| | 47. බෝලවත්ත ගංගොඩ පාර | 64 | — | 26 |
| | 48. පල්ලිය දෙවට පාර | 16 | — | 15 |
| | 49. මත්තප්පු ඔපිසර පාර | 21 | 10 | 21 |
| | 50. පල්ලම පාර | 48 | — | 20 |
| | 51. කඩයිම් පාර | 15 | 3 | 17 |
| 8. බ. නයිනමඩම | 52. දූම්මලදෙනිය පාර | 40 | — | 18 |
| | 53. රුක්කත්තනගහ පාර | 56 | — | 18 |
| | 54. සුදුවැල්ල පාර | 25 | 17 | 16 |
| | 55. පල්ලිය ළඟ පාර | 34 | 17 | 17 |
| | 56. මුට්ටුවතොටුපල පාර | 23 | 16 | 18 |
| | 57. මීල්ලගහපාර දකුණ | 14 | — | 12 |
| | 58. මීල්ලගහ පාර උතුර | 9 | 3 | 12 |
| | 59. මෙදච්චි පල්ලම පාර | 13 | 14 | 15 |
| | 60. දල්පදදූ පාර | 17 | 2 | 19 |
| | 61. නාරංගහ තොටුපල පාර | 4 | 14 | 11 |
| | 62. ගිංඔය පාර | 11 | 17 | 18 |
| 9. මිරිස්සන්කොටුව | 63. ගෝනාවිල පාර අංක 1 | 37 | 6 | 23 |
| | 64. ගෝනාවිල පාර අංක 2 | 40 | 11 | 24 |
| | 65. පෝරන් පාර | 32 | 13 | 20 |
| | 66. හරස් පාර | 20 | 13 | 12 |
| | 67. කුඹුර පාර | 28 | 4 | 18 |
| | 68. වැව පාර | 9 | 2 | 6 |
| | 69. ගෝනාවිල පාර අංක 3 | 22 | 12 | 20 |
| 10. බොරලැස්ස | 70. කඩයිම් පාර | 72 | 1 | 20 |
| | 71. පල්ලිය ළඟ පාර | 45 | 1 | 22 |
| | 72. ගිංඔය පාර | 47 | 4 | 18 |
| | 73. හරස් පාර | 20 | 15 | 18 |
| | 74. මුහුප්පු පාර (මෝල පාර) | 28 | 12 | 22 |
| | 75. දියෝගු මුදලාලි පාර | 44 | — | 22 |
| | 76. වැව බැම්ම පාර | 30 | 16 | 18 |
| | 77. සමදරා කොටුව පාර | 16 | — | 20 |
| | 77. තිඹිරිගහ පාර | 38 | 16 | — |

| ඡන්ද කොට්ඨාශයේ නම සහ අංකය | පාරේ සහ අඩි පාරේ නම | දිග දම්වැල් | යාර | පළල අඩි |
|---|---|---|---|---|
| 11. බ. දුම්මලදෙනිය | 78. පිළුණුවිදන පාර | 45 | 15 | 19 |
| | 79. හන්දිය පාර | 45 | 15 | 20 |
| | 80. රෙජිස්ටර් පාර | 45 | 15 | 25 |
| | 81. දුම්මලදෙනිය මායිම් පාර | 15 | 3 | 17 |
| | 82. තිඹිරිගහ පාර | 24 | — | 21 |
| | 83. දෙමළ මිණිපිටිය පාර | 19 | 8 | 18 |
| 12. නැ. දුම්මලදෙනිය | 84. පන්සල් පාර | 18 | 11 | 20 |
| | 85. වෙන්නප්පුව පාර (දකුණ) | 25 | 16 | 21 |
| | 86. දුම්මලදෙනිය පාර | 16 | — | 20 |
| 13. වෙන්නප්පුව | 87. පෝස්ට් ඔපිස් පාර | 46 | 12 | 28 |
| | 88. පරණ පාර | 36 | — | 16 |
| | 89. පරණ වීදි පාර | 56 | 9 | 19 |
| | 90. ඒ දණ්ඩ පාර | 84 | 9 | 28 |
| | 91. උණගස් දෙවට පාර | 15 | 3 | 16 |
| | 92. සාප්පුව පාර | 5 | 16 | 14 |
| | 93. මත්තප්පු ඔපිසර පාර | 12 | 15 | 17 |
| | 94. වෙන්නප්පුව පාර | 8 | 1 | 20 |
| | 95. කොළින්ජාඩිය පාර | 16 | 13 | 20 |
| | 96. සියඹලාගහ පාර | 28 | 6 | 13 |
| | 97. රුක්කත්තනගහ පාර | 15 | — | 20 |
| | 98. ගොරකගස් හන්දිය පාර | 15 | 13 | 26 |
| | 99. කුරිසිගහ තොටුපල පාර | 15 | 3 | 20 |
| | 100. ආලේලූයා පාර | 49 | 10 | 22 |
| | 101. බැල්ජියම් කොටුව පාර | 32 | 17 | 20 |
| | 102. වැව පාර | 15 | 19 | 12 |
| | 103. හරස් පාර | 12 | 18 | 13 |
| 14. උල්හිටියාව | 104. ආරච්චි පාර | 26 | — | 18 |
| | 105. පුරෙආරච්චි පාර | 45 | 4 | 18 |
| | 106. එලියස්ගමපාර (අලුත්පාර) | 27 | — | 20 |
| | 107. කන්තෝරුව පාර | 53 | 11 | 20 |
| | 108. පල්ලිය පාර | 48 | 5 | 20 |
| | 109. සියඹලාගහ පාර | 56 | 16 | 25 |
| | 110. කඩවත පාර | 45 | 8 | 25 |
| | 111. ගම්කඩයිම් පාර | 48 | 6 | 25 |
| | 112. මුහුදු වෙරළ පාර අංක 3 | 19 | 15 | 22 |
| | 113. මුහුදු වෙරළ පාර අංක 2 | 6 | 1 | 13 |
| | 114. මුහුදු වෙරළ පාර අංක 3 | 9 | 5 | 25 |
| 15. කොළින්ජාඩිය | 115. සූසෙ පාර, නැගෙනහිර | 52 | 9 | 23 |
| | 116. සූසෙ පාර බටහිර | 45 | 7 | 25 |
| | 117. පරණ පාර | 55 | 8 | 31 |
| | 118. හල්මිල්ල කැලේ පාර | 35 | 6 | 27 |
| | 119. මෝල පාර | 20 | 17 | 20 |
| 16. නැ. කටුනේරිය | 120. වැව පාර | 29 | — | 23 |
| | 121. පරණ පාන් කඩේ පාර | 46 | 8 | 25 |
| | 122. නා කැලේ පාර | 26 | — | 24 |
| | 123. මෝල පාර | 29 | 13 | 17 |
| | 124. පරණ පාර | 82 | 18 | 25 |
| | 125. සමිති පාර | 23 | 19 | 15 |
| 17. බ. කටුනේරිය | 126. බැන්කඩේ පාර | 39 | 1 | 18 |
| | 127. ඔරුතොටුපල පාර | 40 | 1 | 17 |
| | 128. අරක්කු තැබෑරුම පාර | 38 | 11 | 22 |
| | 129. සිල්වෙස්ත්‍රි පාර | 39 | 13 | 16 |
| | 130. ගල්මල් පඳුර පාර | 39 | 13 | 18 |
| | 131. ජාන්ස අඩි පාර | — | — | — |
| | 132. බෙත් කඩේ පාර | — | — | — |
| ...කම්මල්පත්තු ගම්කායර්සභා ප්‍රදේශයේ මුහුදුබඩ පාර | | 280 | — | 12 |

---

## ගම්සභා ආඥපනත—198 පරිච්ඡේදය

### උඩපළාත ගම්කාර්ය සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපළාත ගම්කායර් සභාව විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. එච්. පද්මසිරි,
උඩපළාතේ ගම්කායර් සභාවේ
සභාපති තැන.

උඩපළාත ගම්කායර් සභා කායර්ාලය,
රාගල, හල්ග්‍රන්ඔය. 8 ජූලි, 1960,

### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා පොදු අතුරු ව්‍යවස්ථා ආඥපනතේ 3 වන වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ උඩපළාත ගම්කායර් සභාව විසින් 1953ක්වූ ඔක්තෝබර් මස 30 වෙනි දින අංක 10,607 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරණ ලද යෝජනාවෙන් සම්මතකරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග හා පළල අනුව සාදා හෝ නැවත සාදා පවත්වාගෙන යනු ලබන බව මෙයින් යෝජනා කරනු ලැබේ :—

| පාරේ අංකය | කොට්ඨාශයේ නම | පාරේ නම | දිග දම්වැල් | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | කුරුපනාවෙල | ඔලගම පාර | 30 | 4 |
| 2. | එම | දඹගොල්ල පාර | 29½ | 4 |

| පාරේ කොට්ඨාශයේ අංකය | නම | පාරේ නම | දිග දම්වැල් | පළල අඩි |
|---|---|---|---|---|
| 3. | එම | වඩුකුඹුර පාර | 34½ | 4 |
| 4. | එම | තැන්නහේන පාර | 35½ | 4 |
| 5. | එම | වටගොඩ අංක 1 පාර | 25 | 4 |
| 6. | එම | වටගොඩ අංක 2 පාර | 16½ | 4 |
| 7. | එම | වත්තෙකුඹුර පාර | 37 | 4 |
| 8. | එම | කුරුපනාවෙල පාර | 80 | 14 |
| 9. | අඹලියද්ද | තැන්නෙවත්ත පාර | 97 | 4 |
| 10. | එම | ඔලගම පාර | 35 | 4 |
| 11. | එම | තැන්නෙවත්ත අලුත් පාර | 22 | 4 |
| 12. | එම | හපුගස්තැන්න පාර | 66 | 4 |
| 13. | එම | ගල්කඩපතන පාර | 62 | 4 |
| 14. | එම | සූරියගහපතන ඩෙල්මාර් පාර | 27 | 4 |
| 15. | එම | රජවත්ත පාර | 60 | 4 |
| 16. | එම | හපුගස්තැන්න අංක 2 පාර | 23 | 4 |
| 17. | එම | ඔලගම අලුත් පාර | 38 | 4 |
| 18. | එම | මහ කුඹුර පාර | 44 | 4 |
| 19. | එම | අලකොලමඩපතන පාර | 50 | 4 |
| 20. | එම | ගල්කඩ පාර | 24 | 4 |
| 21. | එම | ගල්කඩපතන අංක 1 පාර | 19 | 4 |
| 22. | එම | ගල්කඩපතන අංක 2 පාර | 40 | 4 |
| 23. | එම | සොහොන්පිටිය පාර | 50 | 5 |
| 24. | මාලියද්ද | වටගොඩ පාර | 84 | 4 |
| 25. | එම | ගල්කඩ පාර | 35½ | 4 |
| 26. | එම | වැල්කරද පාර | 49 | 4 |
| 27. | එම | මඩුගස්තැන්න පාර | 65½ | 4 |
| 28. | එම | ලබුලැස්ස පාර | 6 | 4 |
| 29. | එම | ගුරුගල පාර | 30 | 4 |
| 30. | එම | ගන්ගරාගොල්ල පාර | 23½ | 4 |
| 31. | රුපහ | බබරාගල පාර | 88 | 4 |
| 32. | එම | රිලාගල පාර | 95 | 4 |
| 33. | එම | කොටබේ පාර | 71 | 4 |
| 34. | එම | කුඩාවේ පාර | 16 | 4 |
| 35. | එම | දූම්මලගොඩ පාර | 70 | 4 |
| 36. | එම | බලගහ ඇල්ල පාර | 178 | 4 |
| 37. | එම | හපුගස්තැන්න පාර | 22 | 4 |
| 38. | එම | අලකොලඇල්ල පාර | 31 | 4 |
| 39. | එම | දිඹුල්ගහපතන පාර | 28½ | 4 |
| 40. | එම | හෙලගම පාර | 55 | 4 |
| 41. | එම | මාතැවිල්ල පාර | 15 | 4 |
| 42. | එම | මැදහින්න පාර | 42 | 4 |
| 43. | එම | සූරියකැටිය පාර | 38 | 4 |
| 44. | එම | දෙහිගස්වත්ත පාර | 30 | 4 |
| 45. | එම | අලගහතැන්න පාර | 37 | 4 |
| 46. | රාගල නගරය | නිවාස යෝජනා ක්‍රම අතුරු පාර | 9 | 6 |
| 47. | එම | නගරයේ රවුන් පාර | 67 | 10 |
| 48. | එම | පන්සල් පාර | 22 | 5 |
| 49. | එම | ස්ටැපඩ් පාර | 30 | 12 |
| 50. | එම | නගරයේ පාර | 29 | 25 |
| 51. | එම | ලිඩස්ඩේල් අලුත් පාර | 24 | 10 |
| 52. | එම | ටවුම—නුවර එළි පාර | 2 | 14 |
| 53. | එම | ටවුම—සී. ජී. ආර්. අංක 1 පාර | 2 | 8 |
| 54. | එම | ටවුම—සී. ජී. ආර්. අංක 2 පාර | 1½ | 6 |
| 55. | එම | නිල්දන්ඩාහින්න පාර | 33 | 14 |
| 56. | එම | මැදවත්ත පාර | 30 | 10 |
| 57. | එම | කායඞාල—ටවුන් පාර | 2 | 4 |
| 58. | එම | කායඞාල—බස්නැවතුම් පොල පාර | 4 | 25 |

---

## ගම්සභා ආඥාපනත—198 පරිච්ඡේදය

### රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ උඩපත්තු ගම් ප්‍රදේශය

රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ උඩපත්තු ගම් ප්‍රදේශයේ, පාලන නිලධාරි තැන වන මා විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇල්. ජී. සිරිවර්ධන,
කුරුවිටි කෝරළේ උඩපත්තු ගම් ප්‍රදේශය
පාලන නිලධාරි තැන.

ගම්ප්‍රදේශ කායඞාලයය,
කුරුවිටි, අගෝස්තු 1, 1960.

### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සහා පොදු අතුරු ව්‍යවස්ථා ආඥාපණතේ 3 වගන්තියේ 1 උපවගන්තිය යටතේ කුරුවිටි කෝරළේ උඩපත්තු ගම් ප්‍රදේශයේ, ගම්කායඞ සභාව විසින් වර්ෂ 1954ක්වූ ජනවාරි මස 29 වෙනි දින අංක 10,634 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල IV කාණ්ඩයේ 1 අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග හා පළල අනුව සාද හෝ නැවත සාද පවත්වාගෙනයනු ලබන බවත්, ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථාවල 6 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ, මෙහි අංක :—3, 5, 6, 10, 11, 16, 21, 28, 29, 30, 40, 44, 50, 55, 56, 57, 64, 65, 68, 72, 73, 74, 77, 86, 91 දරණ පාරවල් වල, ලොරි, බස් සහ වැන්රථ ගමනා ගමනය තහනම් කිරීමත් මෙයින් තීරණය කරනු ලැබේ :—

| පාරේ අංකය | පාරේ නම | දිග දම්වැල් | පළල අඩි |
|---|---|---|---|
| 1. | බඩහැල්ගොඩ ජනපදයට යන පාර | 140 | 12 |
| 2. | බටතොට-ගල්කොටුව වත්ත පාර | 280 | 12 |
| 3. | බෝදිමලුව-තෙප්පනාව පාර | 310 | 18 |
| 4. | බෝමලුගොඩැල්ල-තෙපුලන්ගොඩ පාර | 90 | 9 |
| 5. | බෝටියාව-කොස්ගල පාර | 70 | 18 |
| 6. | දෙල්ගමුව-එරත්නමංකඩ පාර | 150 | 18 |
| 7. | දේවාලේගාවා-කපුගම්පිටිය පාර | 60 | 12 |
| 8. | ඒදණ්ඩවල-කහහේන්ගම පාර | 120 | 16 |
| 9. | එක්නැලිගොඩ-පලාබද්දල පාර | 560 | 18 |
| 10. | එල්ලාවල-තෙප්පනාව පාර | 360 | 18 |
| 11. | එල්ලාවල-නාකන්දල පාර | 80 | 18 |
| 12. | එල්ලාවල-කණුග්ගල්ල-පරණගම පාර | 160 | 12 |
| 13. | එරත්න-කඩවත පාර | 280 | 9 |
| 14. | එරත්න-පලාබද්දල පාර | 300 | 12 |
| 15. | එරත්න-රතුගෙදර පාර | 70 | 12 |
| 16. | එළුවාමලඇල්ල-ඇඹුල්දෙණිය පාර | 240 | 16 |
| 17. | ගමගෙකන්ද-පලාබද්දල පාර | 140 | 9 |
| 18. | ගමගෙකන්ද-පවනැල්ල පාර | 120 | 9 |
| 19. | ගෝනපිටිය-දහනක්වත්ත පාර | 15 | 12 |
| 20. | ගෝනපිටිය-පාතේගම පාර | 80 | 12 |
| 21. | ගොරකඇල-අරුක්පිටිය පාර | 90 | 18 |
| 22. | ගෝනපිටිය-පුවක්හේන පාර | 60 | 12 |
| 23. | ගලබොඩ-දෙනවක පාර | 92 | 12 |
| 24. | ගලබොඩ-රත්ගම පාර | 200 | 9 |
| 25. | ගහබොඩ-මහවත්තකන්ද පාර | 245 | 12 |
| 26. | හල්පෙ-කොස්ගල පාර | 88 | 12 |
| 27. | හල්පෙ-මිල්ලකඩේ පාර | 85 | 18 |
| 28. | හිග්ගස්හේන-දෙමැද පාර | 360 | 18 |
| 29. | හිග්ගස්හේන-මල්වත්තඕවිට පාර | 90 | 18 |
| 30. | හිග්ගස්හේන-බඩහැල්ගොඩ පාර | 100 | 18 |
| 31. | හිදැල්ලෙන-අමුතාගොඩ පාර | 125 | 16 |
| 32. | කඩවත-අඩවිකන්ද පාර | 160 | 16 |
| 33. | කඩවත-ගහබොඩ පාර | 120 | 12 |
| 34. | කඩවත-මල්වල පාර | 240 | 12 |
| 35. | කඩවත-මැදගම පාර | 175 | 12 |
| 36. | කහන්ගම-කුරුගම්මෝදර පාර | 480 | 12 |
| 37. | කහන්ගම-සිංඤෝගෙතොටුපල පාර | 40 | 12 |
| 38. | කහන්ගම-මංගෙදර පාර | 160 | 12 |
| 39. | කඳන්ගොඩ-ගෝනපිටිය පාර | 80 | 12 |
| 40. | කඳන්ගොඩ-ලෙල්ලාගොඩ පාර | 120 | 16 |
| 41. | කැකුණහින්න-පලාබද්දල පාර | 360 | 9 |
| 42. | කැටවල-ඉඳුරුව පාර | 120 | 9 |
| 43. | කොස්ගල-දෙඩම්පෙ පාර | 86 | 12 |
| 44. | කොටුවත්තකඩේ-ගෝනපිටිය පාර | 80 | 12 |
| 45. | කුඩාව-මැදගම පාර | 480 | 9 |
| 46. | ලස්සෙකන්ද-කැකුණහින්න පාර | 160 | 12 |
| 47. | ලස්සෙකන්ද-ගහබොඩ පාර | 89 | 9 |
| 48. | මල්වල-මීහිටිය පාර | 80 | 12 |
| 49. | මල්වල-ලෙල්ලොපිටිය පාර | 135 | 12 |
| 50. | මහවෙල-ඔතුවන-පොත්දෙණිය පාර | 160 | 16 |
| 51. | මංගෙදර-ගබ්බෙල පාර | 180 | 12 |
| 52. | මංගෙදර-කහහේන්ගම පාර | 168 | 12 |

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

සටහන.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත් කර ගනු ලබන නිලධාරීන් ය.

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින් ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම් සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. යුද්ධ සේවා අනුග්‍රහය.—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම ආකාරයකින් ම සුදුසුකම් ලැබ සිටින මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූ අයට ද, සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිට සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර සෑම කෙනෙකුටම ද, ඔව්හු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුවුදයක ලෙස, නො කඩවා සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දිනත්, ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදතුර තමන් එසේ සේවයේ යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. ප්‍රසිද්ධ කොට ඇති තනතුරෙහි පන්තියට හා ශ්‍රේණියට ම අයත් වන තනතුරු උසුලන පළාත් පාලන සේවා සාමාජිකයන්ට අධ්‍යාපන සුදුසුකම් නො තකා, පළ කොට ඇති ඇබෑර්තුවට මාරු වී යෑම සඳහා අයදුම් පත් එවිය හැකි ය.

9. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් තම තමන් සේවය කරන ප්‍රාදේශික බල මණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි සපිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරා ගනු ලැබුව හොත් ඔවුන් සවකීය තනතුරු වලින් මුදාහරින්ට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කළ යුතු යි.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iv) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් නැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම් පත් වනාහි මීට යා කොට ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙළ කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නාමට නොවේ) එවිය යුතුයි.

(viii) අවසාන දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නො ලැබේ.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පතේ ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම් පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරට අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර සභාපතිගේ පෞද්ගලික නාමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම් පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියළුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ සවකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) උප්පැන්න සහතිකය, (2) ඉංග්‍රීසි/සිංහල/දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (3) චරිත සහතිකය, (4) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වේ නම් වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 9 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

———————— තනතුරු සඳහා වූ අයදුම් පතයි (——)

1. පුරප්පාඩුව ප්‍රසිද්ධ කොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරින් :————.

ජාතිය :————.

(ඔබ ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැලැසුම් අංකයත් සඳහන් කරන්න).

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි).

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස : අවුරුදු————, මාස————, දින————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
| --- | --- | --- |
| | | |

5. උපන් ස්ථානය—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි).

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
| --- | --- | --- | --- | --- | --- |
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |
| 3. | | | 3. | | |
| 4. | | | 4. | | |
| 5. | | | 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස් වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත්වූ දිනයත් හා අස් වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන (තනතුරු, පළාත් පාලනායතන හා කාලසීමාවන්) : ————.

(ඇ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිත ද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුණ දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම හා භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද ? :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. **විශේෂ සුදුසුකම්.**—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

දිනය :————.

————————,
අයදුම්කරුගේ අත්සන.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### වින්නඹු සේවිකා තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා බුත්තල-වැදිරට ගම්කායී සභාවේ සභාපති අයදුම් පත්‍ර කැඳවයි.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අයත් වාර්ෂික වැටුප් රු. 696න් පටන් ගෙන වර්ෂයකට රුපියල් 18 බැගින් 19 වරක් වැඩිවී රුපියල් 1,038 තෙක් නගී. එහි රුපියල් 822 සහ 948 වාර්ෂික වැටුප්වලට ප්‍රථමයෙන් කාර්යක්ෂමතා කඩඉම් ඇත්තේ ය.

3. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) වයස.—1960 අගෝස්තු 26 වැනි දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමාගේ දක්ෂතා පිළිබඳ සහතික දරණ ලියාපදිංචි වූ වින්නඹු සේවිකාවෝ විය යුතුයි. සෞඛ්‍ය මණ්ඩල වැඩ ගැන පළපුරුද්දක් ඇති, සිංහලෙන් හා දෙමළෙන් කතා කළ හැකි අය ගැන විශෙෂයෙන් සලකා බලනු ලැබේ.

4. පළාත් පාලන සේවා සාමාජිකාවන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සැළකිල්ලට ගනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. සියළුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. යම්කිසි අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රය, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින තුනක් ඇතුළත ලැබුණු බව දන්වා එවනු නොලැබුව හොත්, වහාම ඒ බව බුත්තල-වැදිරට ගම්කායී සභාවේ සභාපති වෙත දැන්විය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, තම ඉල්ලුම් පත්‍රය සළකා බැලීම සඳහා ඇති යම්කිසි හිමිකමක් වෙයි නම් එය නැති වන්නේ ය.

7. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙළ කොට, 1960 අගෝස්තු 26 වැනි දිනට හෝ ඊට පළමු බුත්තල-වැදිරට ගම්කායී සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

ඩබ්ලිව්. ජී. ඇම්. ඇල්බට් සිල්වා,
බුත්තල-වැදිරට ගම්කායී සභාවේ සභාපති.

1960 අගෝස්තු මස 1 දින,
මොනරාගල, ගම්කායී සභා කාර්යාලයේදීය.

---

## පළාත් පාලන සේවය

### උඩපනේ ගම්කායී සභාවේ පියුන් තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 540—22 × 12—රු. 804. රු. 636 සහ රු. 732 වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩයිම්.

3. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) වයස : 1960 සැප්තැම්බර් මස 2 වැනි දිනට වයස අවුරුදු 20ට නොඅඩු 30ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල පස්වැනි ප්‍රමාණයෙන් හා ඉංග්‍රීසි 3 වැනි ප්‍රමාණයෙන් සමත්වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනිත් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1960 සැප්තැම්බර් මස 2 වැනි දිනට හෝ ඊට පළමු උඩපනේ ගම්කායී සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුය.

කේ. ඇම්. අප්පුහාමි,
උඩපනේ ගම්කායී සභාවේ සභාපති.

1960 අගෝස්තු මස 9 වැනි දින,
පුන්ඩලුඔය, උඩපනේ ගම්කායී සභා කාර්යාලයේදීය.

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී—බී. 136/47/ඇල්.ජී.ඩී—ජී.එච්. 11/3ඩී.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ගන්දහය දකුණු ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960වේ ජූලි මස 28 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

**ආයුර්වේද බෙහෙත් ශාලා**

1. ගම්සභා ආඥාපනතේ 43 “ බී. බී.” වගන්තිය යටතේ කාර්ය සභාව විසින් කපුලියද්දේ පිහිටුවන ලද ආයුර්වේද බෙහෙත් ශාලාව කාර්ය සභාව විසින් නඩත්තු කළ යුතුවත් හැර, 1941කේ අංක 17 දරන ස්වදේශීය ඖෂධ පිළිබඳ ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නාවූ අයෙකු භාරයේ තැබිය යුතුද වන්නේය.

2. කාර්ය සභාව විසින්, ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා අවශ්‍ය අරමුදල් අවුරුදු පතා එහි පොදු අරමුදලින් ලබාගෙන පරිහරණය කළ යුතුවාත් හැර, එසේ පරිහරණය කිරීම සඳහා එම අරමුදල් කාර්ය සභාවේ වාර්ෂික අයවැය ලේඛනයෙන් හෝ කාර්ය සභාව විසින් ඒ සඳහා වරින්වර සම්මත කරගනු ලබන අතිරේක ඇස්තමේන්තු වලින් හෝ වෙන්කර ගතයුතු වන්නේය.

3. කාර්ය සභාව විසින්, ආයුර්වේද බෙහෙත් ශාලාවට සපයනු ලබන බෙහෙත් ද්‍රව්‍යවල වියදමින් කොටසක් පියවා ගැනීම පිණිස ආයුර් වේද බෙහෙත් ශාලාවෙන් ප්‍රතිකාර ලබන එක් එක් රෝගියාගෙන් ශත 25 බැගින්වූ ගාස්තුවක් අයකළ යුතුය. සභාපති තුමා විසින් හෝ සභාපති තුමා විසින් ඒ සඳහා බලය පවරනු ලබන වෙනත් යම් නිලධාරියෙකු විසින් හෝ කාර්ය සභාව අනුමතකරන ආකෘති පත්‍රයකින් රෝගියකුගෙන් අයකරනු ලබන සෑම ගාස්තුවක් සඳහාම රිසිට්පතක් නිකුත් කළ යුතුය. එකී සෑම රිසිට් පතකම කාබන් අනු පිටපතක් තිබිය යුතුවාත් හැර එහි අනුපිළිවෙළින් අංක යොදා තිබිය යුතුද වන්නේය.

4. සභාපති තුමා විසින් ස්වකීය අභිමතය අනුව දුප්පත්කම නිසා ඕනෑම රෝගියෙකු 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තුවෙන් නිදහස් කළහැකි වන්නේය.

5. (3) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන වලට යටත්ව, ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රතිකාර නොමිළයේ කළ යුතු වන්නේය.

6. සභාපති තුමා විසින් දෙසැම්බර මස 31 වැනිදායින් අවසන් වන එක් එක් අවුරුද්දක් සඳහා එකී අවුරුද්දේ බෙහෙත් ශාලාවට ලැබෙන ආදායම සහ වියදම පෙන්නුම් කරන ප්‍රකාශනයක් සම්පාදනය කිරීමට සැළැස්විය යුතු වන්නේය.

7. මේ අතුරු ව්‍යවස්ථාවල—

“ ආයුර්වේද බෙහෙත් ශාලාව ” යනුවෙන් කාර්ය සභාව විසින් පිහිටුවා නඩත්තු කරගෙන යනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව අදහස් කරනු ලැබේ.

“ සභාපති තුමා ” යනුවෙන් කාර්ය සභාවේ සභාපති තුමා අදහස් කරනු ලැබේ.

“ කාර්ය සභාව ” යනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවා හැට ගන්දහේ දකුණු ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

# විවිධ දැන්වීම්

## පිස්සු බලු රෝගය

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් පිළිබඳ පිස්සු බලු රෝග ආඥාපනතේ 11 වැනි වගන්තිය ප්‍රකාර (333 වැනි පරිච්ඡේදය) කුරුණෑගල නාගරික සභාවේ පාලන සීමා ඇතුළත පිහිටි කිසියම් ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හෝ පෞද්ගලික ගොඩනැගිල්ලක්, මිදුලක්-ගෙවත්තක් නොවන කිසියම් ස්ථානයක සිටින නොබඳින ලද හෝ දත්කාගත නොයන ලද කිසියම් බල්ලකු මා විසින් ලියවිල්ල කින් දෙන ලද බලයලත් කිසියම් පුද්ගලයකු විසින් එවෙලෙහිම විනාශ කර දමනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1960 අගෝස්තු මස 11 වෙනි දින සිට මාස 6ක් (මාස හයක්) වලංගු වන්නේය.

අරල් ද අල්විස්,
නාගරික කොමසාරිස්
කුරුණෑගල.

1960 අගෝස්තු මස 11 වැනි දින,
නාගරික සභා කාර්යාලය,
කුරුණෑගල.

---

## පාතදුම්බර පලිස්පත්තුව බටහිර ගම්කාර්ය සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1961 වර්ෂයේ මස් කඩයක් පවත්වාගෙන යාමට බල පත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බැවින් මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන පාතදුම්බර පලිස්පත්තුව බටහිර ගම්කාර්ය සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුඩ වන්නේ නම් ඒ කුමණ කරුණු නිසාද යනවග ඇතුළත් ලියකියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට සති දෙකක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරන 1947 අංක 14 දරන ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරන ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම : ඈස්. හලල්දීන් ;
ස්ථානය : තෙල්දෙනිය ගම ;
වෙළඳාම : හරක්මස්.

එච්. ඇම්. හේරත් බන්ඩා,
පලිස්පත්තුව බටහිර ගම්කාර්ය සභාවේ ප්‍රධාන තුමා.

ගම්සභා කාර්යාලය, නාරන්පනාව.
9.8.60.

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ගම්කාර්ය සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1960 වර්ෂයට මස් කඩ පවත්වාගෙන යෑමට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන නාරම්මල ගම්කාර්ය සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යනවග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට සති දෙකක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම්දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඇම්. අයි. ඇම්. සුලෙයිමන්, ගරු ලේකම්, මඩිගෙ-පැන් තැනිගොඩ මුස්ලිම් පල්ලියේ රස්ටි කොමිටිය, නාරම්මල | මඩිගෙ-පැන්තැනිගොඩ ඉඳුමාකනත්තවත්ත | හරක් මස් |
| 2. ඊනා සාවෙල් හමීදු, නාරම්මල | පොල්ගහයායේ-පරණ වත්ත | හරක් මස් සහ එළු මස් |

පී. බී. මැදගොඩ,
නාරම්මල ගම්කාර්ය සභාවේ ප්‍රධානතැන.

ගම්කාර්ය සභා කාර්යාලයය,
නාරම්මල, 1960 අගෝස්තු 10.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.